# ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

## පූර්විකාව

ගෝලීය උණුසුම්වීම හේතුවෙන් ඇති වී ඇති දේශගුණ විපර්යාස විසිඑක් වන සියවසේ ප්‍රධාන මානව සංවර්ධන අභියෝගය ලෙස සමස්ත ලෝක වාසීන් විසින් හඳුනාගෙන ඇත. දේශගුණ විපර්යාස සිදුවෙමින් පවතින බවත්, ගෝලීය උණුසුම්වීම මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන හරිතාගාර වායු ඉතා අධික ලෙස වායුගෝලයට මුදාහැරීමේ ඍජු ප්‍රතිඵලයක් බවත්, විශේෂයෙන්ම පොසිල ඉන්ධන දහනය මෙයට වැඩි වශයෙන් දායක වන බවත්, දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්රාජ්‍ය මණ්ඩලය (IPCC) මගින් තහවුරු කර ඇත. ඒ අනුව, නිශ්චිතවම වර්තමාන හා අනාගත පරම්පරාවට දේශගුණ විපර්යාස තර්ජන හමුවේ ජීවත් වීමට සිදු වන බව පැහැදිලි වී ඇත. දේශගුණ විපර්යාස බලපෑම් හමුවේ, සියලු ජාතීන් අවදානමට ලක්ව ඇති අතර, විශේෂයෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ඒ සඳහා අනුවර්තනය වීමට ඇති අඩු හැකියාව නිසා එම රටවල් දැඩි අවදානමට ලක් ව ඇත.

සංවර්ධනය වෙමින් පවත්නා නිවර්තන කලාපීය දිවයිනක් වන ශ්‍රී ලංකාව ද, දේශගුණ විපර්යාස වල දැඩි බලපෑමට ලක් වී ඇත. අධික තීව්‍රතාවකින් යුත් වර්ෂාපතනයකින් පසු ව ඇති වන හදිසි ජලගැලීම් හා නායයෑම් ද දීර්ඝ වියළි කාලගුණ තත්ත්ව හේතුකොට ගෙන ඇතිවන ජල හිඟය ආදී අන්තගාමී කාලගුණ තත්ත්ව ද ශ්‍රී ලංකාවේ සුලභ තත්ත්වයක් බවට පත් වී ඇත. ඉක්මනින් වෙනස්වන සුළු කාලගුණ රටාවක් සහිත දිවයිනක් වන ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් ව්‍යාකූල තත්ත්වයට පත්කිරීමට දේශගුණ විපර්යාස නිසා ඇතිවන අහිතකර බලපෑම් හේතු වී ඇත. එමනිසා, අහිතකර දේශගුණ විපර්යාස වලට මුහුණදීමට හැකිවන පරිදි රට තුල දේශගුණ විපර්යාස අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම ඉක්මන් හා අත්‍යාවශ්‍ය කාර්යයකි. අනුවර්තන ක්‍රියාමාර්ග කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙමින්, ශ්‍රී ලංකාව  තිරසාර සංවර්ධන රාමුව තුල සහ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ සහ එහි කියතෝ සන්ධානයෙන් සම්මත වූ මූලධර්මයන්ට අනුකූලව හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ගෝලීය ප්‍රයත්නයන්ට සක්‍රියව දායකවෙමින් සිටී.

ක්ෂයවන පාරිසරික අවකාශයක් තුල, යහපත් සහ ගුණාත්මක ජීවිතයක් ලබාදීම සඳහා තම ආර්ථිකයන් දියුණු කිරීම වර්තමානයේ දී සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මුහුණපාන ප්‍රබල අභියෝගයක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකාවට මෙම අභියෝගයන් හට මුහුණ දීමට සිදු වී ඇත්තේ ගෝලීය තත්ත්වයන් හා බැඳී පවතින  යටිතල පහසුකම් දියුණු කිරීමට ලබාදෙන මූල්‍යමය අධාර අඩුකිරීමේ ප්‍රවණතාව, බලශක්ති වෙළෙඳපොළෙහි අස්ථාවරබව මෙන්ම අහාර සුරක්ෂිතතාව, වෙළෙඳ, වාණිජ හා කර්මාන්ත සංවර්ධන ක්ෂේත්‍රයන් හා බැඳී පවතින අර්බුදකාරී තත්වයන් හට මුහුණදෙන අතරතුර දේශගුණ විපර්යාස  පවතින ගැටළු වලටද මුහුණ දීමට සිදුවීමයි.

මෙම තත්ත්ව යටතේ සියළු පාර්ශවකරුවන් වෙත දේශගුණ විපර්යාස නිසා ඇතිවන අහිතකර බලපෑම් වලට ඵලදායි සහ කාර්යක්ෂම ලෙස විසඳුම් සෙවීමට අවශ්‍ය මගපෙන්වීම මෙම ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කෙරේ.

මෙම දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය "ඉදිරි දැක්ම", "මෙහෙවර", "ඉලක්කය" සහ "නියමු මූලධර්ම" පදනම් කරගත් පුළුල් ප්‍රතිපත්ති ප්‍රකාශණ සහිතව සකස් කර ඇත. එම ප්‍රතිපත්ති ප්‍රකාශණ දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම නිසා ඇතිවන අවදනම, දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අනුවර්තනය, හරිතාගාර වායු විමෝචනය අවම කිරීම, තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය, දැනුම් කළමනාකරණය සහ පොදු ප්‍රකාශණ යටතේ ගොනුකොට ඇත. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශ අර්ථවත් ලෙස ක්‍රියාත්මක කර දේශගුණ විපර්යාස අභියෝග ජයගැනීම සඳහා සෑම සියලු දෙනාම එක්ව සහයෝගීව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## දැක්ම

දේශගුණ විපර්යාසන්හි අහිතකර ප්‍රතිවිපාක හමුවේ සාර්ථකව මුහුණදිය හැකි අනාගතයක් හිමි ශ්‍රී ලංකාව

## මෙහෙවර

දේශගුණ විපර්යාස ආශ්‍රිත ගැටලු නිරාකරණයට දේශීයව කටයුතු කරමින් ගෝලීය ප්‍රයත්නයන්ට ද මැදිහත් වීම.

## ඉලක්කය

තිරසාර සංවර්ධන රාමුව තුළ දේශගුණ විපර්යාස අවම කර ගැනීම සහ ඊට අනුවර්තනය වීම.

## අරමුණු

- කාලීනව වෙනස් වන දේශගුණ තත්ත්ව හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ඇති විය හැකි අවදානම් තත්ත්ව පිළිබඳ ප්‍රජාව සංවේදීකරණය හා දැනුම්වත් කිරීම.
- දේශගුණ විපර්යාස හේතුවෙන් මහජනතාවට, ඔවුන්ගේ ජීවනෝපායන්ට හා පරිසර පද්ධතීන්ට ඇති විය හැකි අයහපත් බලපෑම් වළක්වා ගැනීම/අවම කර ගැනීම සඳහා අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම.
- හරිතාගාර වායු විමෝචනය අවම කර ගනිමින් තිරසාර සංවර්ධනය වෙත යොමු වීම.
- තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවන් ප්‍රවර්ධනය කිරීම.
- සමාජය තුළ දේශගුණ විපර්යාස සම්බන්ධ බහුවිධ ගැටලු පිළිබඳ දැනුවත්බව වර්ධනය කිරීම සහ ඊට අදාල නිවැරදි තීරණ ගැනීම සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම.
- දේශගුණ විපර්යාසවල බලපෑම් අවම කිරීම කෙරෙහි ඵලදායි හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම සඳහා දේශීය හැකියාවන් වර්ධනය කිරීම.
- ජාතික සංවර්ධන ප්‍රතිපත්තීන් සහ ක්‍රියාදාමයන් සකස් කිරීමේදී දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන බලපෑම් සැලකිල්ලට ගැනීම සහ ඇතුලත් කිරීම.

## නියමු මූලධර්ම

- දේශගුණ විපර්යාස හේතුවෙන් මිහිතලයේ ජීවීන්ගේ පැවැත්මට ඇති විය හැකි අවදානම් තත්ත්ව හා අප්‍රතිවර්ත්‍ය තර්ජන අවම කර ගැනීමට හා යථා ස්වභාවයට පත්කර ගැනීමට කාලීන ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍යතාවයකි.
- දේශගුණ විපර්යාස හමුවේ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පරිසර හිතකාමී, දේශීය වශයෙන් වැදගත්, සමාජය පිළිගත් සහ ආර්ථිකමය වශයෙන් දරාගත හැකි විය යුතුය.
- දේශගුණ විපර්යාස පිළිබඳ වර්තමාන අභියෝග, තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවට හුරුවීම තුළින් සැලකිය යුතු අයුරින් අවම වේ.
- තිරසාර මානව සංවර්ධනය හා දරිද්‍රතාව පිටුදැකීම අරමුණු කර ගනිමින් පරිසර පද්ධති ස්ථායිතාව සුරක්ෂිත කළ යුතුවේ.
- දේශගුණ විපර්යාස පිළිබඳ අභියෝග ජය ගැනීම සඳහා සියලු පුරවැසියන් හට පොදු දැක්මක් හා වගකීමක් තිබිය යුතුවේ.
- විද්‍යාත්මක පදනමක් සහිත සාක්ෂි නොමැති විට තීරණ ගැනීමේ දී පූර්වාරක්ෂක මූලධර්ම අදාල කර ගත යුතුවේ.

## ප්‍රතිපත්ති ප්‍රකාශ

### (අ) දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම නිසා ඇතිවන අවදානම

**1. අවදානම ඇගයීම**

ශ්‍රී ලංකාව නිවර්තන කලාපීය දිවයිනක් වීම විශේෂ සැලකිල්ලට ගනිමින්, දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් නිසා සමාජ-ආර්ථික හා පාරිසරික ක්ෂේත්‍ර කෙරෙහි කලින් කලට ඇතිවන අවදානම ඇගයීම.

දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති විය හැකි අවදානම පදනම් කර ගනිමින් අනුවර්තන හා අවම කරගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන උපායමාර්ග සකස් කර ගැනීම.

**2. ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ දී දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති විය හැකි අවදානම හඳුනා ගැනීම හා ඒ සඳහා පියවර ගැනීම.**

ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ ස්වාභාවික හා නිර්මිත පරිසරයට අදල සංවර්ධන සැලසුම් හා වැඩසටහන් සකස් කිරීමේදී, දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම් හේතුවෙන් සමාජ ආර්ථික හා පාරිසරික ක්ෂේත්‍ර කෙරෙහි ඇති අවදානම හඳුනාගැනීම සහ ඊට අදාලව ක්‍රියා මාර්ග ගැනීම.

**3. ආපදා කළමනාකරණය**

දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති වන ආපදා වලක්වා ගැනීම/අවම කරගැනීම සහ පාලනය කිරීම තුලින් ප්‍රජාව, පරිසර පද්ධති සහ නිර්මිත පරිසරය ආරක්ෂාකර ගැනීමට උපායමාර්ග සහ යාන්ත්‍රණ සකස් කිරීම.

**4. සෞඛ්‍යයට ඇති වන බලපෑම**

දේශගුණ විපර්යාස හේතුවෙන් සෞඛ්‍යය ක්ෂේත්‍රයට ඇති වන අයහපත් බලපෑම් හඳුනා ගැනීම හා ඊට අදාල විසඳුම් ක්‍රියාත්මක කර මහජන සෞඛ්‍යය ආරක්ෂාකර ගැනීම.

## (ආ) දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අනුවර්තනය

**5. ආහාර නිෂ්පාදනය හා ආහාර සුරක්ෂිතතාව**

දේශගුණ විපර්යාස හේතුවෙන් බෝග, සත්ව නිෂ්පාදන සහ ධීවර කර්මාන්තය යන ක්ෂේත්‍ර කෙරෙහි ඇතිවිය හැකි අයහපත් බලපෑම් සම්බන්ධව කාලීනව ක්‍රියාකරමින් ආහාර නිෂ්පාදනයට ඇති වන බලපෑම් අවම කර ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.

ආහාර නිෂ්පාදනයේ දී, සාම්ප්‍රදායික දැනුමත් එහි භාවිතයත් හඳුනාගැනීම සහ ප්‍රවර්ධනය කිරීම තුලින් දේශගුණ ප්‍රත්‍යස්ථ, පරිසර හිතකාමී, යෝග්‍ය, නව තාක්ෂණ කෙරෙහි උනන්දු කරවීම.

**6. ජල සම්පත් හා ජෛව විවිධත්ව සංරක්ෂණය**

දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අස්ථාවර වර්ෂාපතන රටා, උෂ්ණත්වය ඉහළ යාම හා මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා ජල සම්පත් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම් අවම කර ගැනීමට ක්‍රියාකිරීම. එමෙන්ම වෙනස්වන කාලගුණ රටා හා ප්‍රවණතා පදනම් කර ගනිමින් කාර්යක්ෂම ජල පරිහරණ තාක්ෂණ හා චර්යා ප්‍රවර්ධනය කිරීම.

වෙනස් වන කාලගුණ රටා හා ප්‍රවණතාවන්ට අනුවර්තිත චර්යා හා තාක්ෂණ මගින් ඒකාබද්ධ ජල පෝෂක හා ජල සම්පත් කළමනාකරණය සහ කාර්යක්ෂම ජල භාවිතය ප්‍රවර්ධනය කිරීම.

දේශගුණ විපර්යාස නිසා ස්වාභාවික පරිසර පද්ධති සහ එහි ජෛව විවිධත්වයට ඇතිවන බලපෑම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම.

**7. මානව ජනාවාස හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය**

මානව ජනාවාස, ඉඩම් පරිහරණ සැලසුම්කරණය හා නාගරික සංවර්ධනයේ දී ජාතික වශයෙන් කාලෝචිත අඩු විමෝචන තාක්ෂණ හා යෝග්‍ය අනුවර්තන උපාය මාර්ග ඇතුළත් කරගැනීම.

**8. යටිතල පහසුකම් සැලසුම්කරණය සහ සංවර්ධනය**

යටිතල පහසුකම් සැලසුම්කරණය, සංවර්ධනය සහ නඩත්තු කිරීමේදී අනුවර්ථිත ක්‍රියාමාර්ග ඇතුලත් කිරීම.

**9. වෙරළ සම්පත් කළමනාකරණය**

වෙරළ සම්පත් කළමනාකරණයේ දී මුහුදු මට්ටම ඉහළයාමේ ප්‍රවනතාවය විශේෂ සැලකිල්ලට ගනිමින් අනුවර්ථිත ක්‍රියාමාර්ග ඇතුලත් කිරීම.

## (ඇ) හරිතාගාර වායු විමෝචනය අවම කිරීම

**10. බල ශක්තිය**

රටෙහි පවත්නා පවිත්‍ර සහ පුනර්ජනන බලශක්ති ප්‍රභවයන්ගේ විභව හඳුනාගෙන එහි නිෂ්පාදන වැඩිදියුණු කිරීම හා එම බලශක්ති ප්‍රභව ජනනයට යොදාගැනීමේ ප්‍රායෝගිකත්වය මෙන්ම ආර්ථික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම.

දේශීයව මෙම බලශක්තීන් අවශෝෂණය කිරීමේ හැකියාව හා දිගු කාලීන තිරසාරත්වය සැලකිල්ලට ගනිමින් පවිත්‍ර හා පුනර්ජනන බලශක්ති ප්‍රභව පරිභෝජනය දිරිගැන්වීම.

බලශක්ති පරිභෝජන කාර්යක්ෂමතාව උපරිම කරගැනීම සඳහා ඉල්ලුම් හා සැපයුම් කළමනාකරණය වැඩිදියුණු කිරීමට ක්‍රියා කිරීම.

අහිතකර භාවිත වළක්වා ගැනීම සඳහා යෝග්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම බල ගන්වමින් අඩු කාබන් තීව්‍රතාවයෙන් යුත් ඉන්ධන හා බලශක්ති තාක්ෂණ සඳහා ආර්ථික දිරිගැන්වීම් හඳුන්වා දීම.

**11. ප්‍රවාහනය**

වර්තමානයේ පවත්නා ඉන්ධන ප්‍රභවයන්ගේ දිගුකාලීන තිරසාරත්වය සැලකිල්ලට ගනිමින්, ඒකාබද්ධ පොදු ප්‍රවාහන පද්ධති, අඩු විමෝචන සහිත ඉන්ධන හා ඉන්ධන දහනයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

**12. කර්මාන්ත**

හරිතාගාර වායු විමෝචනය අවමකර ගැනීම සඳහා කර්මාන්ත අංශයේ පාරිසරික කාර්යසාධනය වැඩිදියුණු කිරීම.

සියළුම ක්ෂේත්‍ර හා මට්ටම්වල හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට ස්වයං ඇගයීම තුළින් පූර්ව සැලසුම් ක්‍රම භාවිතාකරමින් හරිත වාර්තාකරණ ක්‍රමවේද ස්ථාපිත කිරීම.

**13. අපද්‍රව්‍ය කළමනාකරණය**

ජාතික වශයෙන් යෝග්‍ය අඩු හරිතාගාර වායු විමෝචන තාක්ෂණ සමග අපද්‍රව්‍ය ජනනය වළක්වා ගැනීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදෙමින් සියලු වර්ග වල අපද්‍රව්‍ය සඳහා ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම යොදාගැනීම.

**14. කෘෂිකර්මාන්තය හා පශු සම්පත්**

තිරසාර සංවර්ධනයේදී පරිසර හිතකාමී හා සමාජීය වශයෙන් පිළිගත් කෘෂිකාර්මික හා පශු සම්පත් ක්‍රමවේද වැඩිදියුණු කිරීම.

සම්ප්‍රදායික දැනුම හා ව්‍යවහාර සුදුසු පරිදි උපයෝගී කරගනිමින් යෝග්‍ය නව තාක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

## (ඇ)තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය

**15. ස්වාභාවික සම්පත් හා ජෛව විවිධත්වය වගකීමෙන් යුතු පරිභෝජනය**

පරිසර හිතකාමී නිෂ්පාදන, ක්‍රියාවලි හා තාක්ෂණ හඳුනාගැනීම, වැඩිදියුණු කිරීම හා ප්‍රචලිත කිරීම මගින් ස්වාභාවික සම්පත් වෙත ඇති වන අහිතකර බලපෑම් අවම කර ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.

වනාන්තර මගින් සපයනු ලබන අනෙකුත් පාරිසරික සේවා සැලකිල්ලට ගනිමින් වන සම්පත් කළමනාකරණයේ දී වනාන්තර මගින් කාබන් තිරකිරීමේ හැකියාව හඳුනා ගැනීම හා වර්ධනය කිරීම.

**16. පරිසර හිතකාමී පරිභෝජනය හා ජීවන රටාවන්**

තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ දී, පරිසර හිතකාමී ජීවන රටා සහ පුරුදු පිළිබඳ ව පුළුල් ප්‍රචාරණයක් සහතික කරමින්, පවුල මූලික කරගත් තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටා ප්‍රවර්ධනය කිරීම.

## (ඉ) දැනුම් කළමණාකරණය

**17. අධ්‍යාපනය, දැනුම්වත් කිරීම හා හැකියා වර්ධනය**

වර්තමාන හා ඉදිරියේදී ඇතිවිය හැකි බහුවිධ දේශගුණ විපර්යාස ගැටලුවලට මුහුණ දීම සඳහා සෑම මට්ටමකටම අයත් විවිධ වූ පාර්ශවයන්ගේ දැනුම්වත්බව, නිපුණතා හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමට අවශ්‍ය බහුවිධ ප්‍රවේශයන් භාවිතා කිරීම.

එම තොරතුරු ලබා ගැනීමට හා හුවමාරු කරගැනීමට සෑම ක්ෂේත්‍රයකට ම අයත් සියලු ස්ථර සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය කිරීම.

**18. සහයෝගීතාව හා හවුල්කාරිත්වය**

දේශගුණ විපර්යාස පිළිබඳ බහුවිධ ගැටලු වලට විසඳුම් සෙවීමේදී හවුල්කරුවන් අතර උපක්‍රමශීලී හවුල්කාරිත්වයක් හා දැනුම හුවමාරුවක් පවත්වා ගැනීම පිළිබඳ උනන්දු කිරීම.

**19. දේශගුණ විපර්යාස පිළිබඳ සංවේදී පරපුරක් බිහිකිරීම**

දේශගුණ විපර්යාස කරුණු කෙරෙහි පූර්වාගමන ක්‍රියා තුළින් සහ වගකීමෙන් ක්‍රියාකළ හැකි සහභාගිත්වයක් ප්‍රවර්ධනය කරමින් පාසල් අධ්‍යාපනය හරහා ජාතික වශයෙන් වැදගත් දේශගුණ විපර්යාස සංවේදී චර්යාත්මක වෙනසක් ප්‍රවර්ධනය කිරීම.

## (ඊ) පොදු ප්‍රකාශ

**20. ආයතනික සම්බන්ධීකරණය**

දේශගුණ විපර්යාස ආශ්‍රිත ක්‍රියාකාරකම් ජාතික,පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් ඵලදායී ලෙස ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සම්බන්ධීකරණය හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇතිකරමින් එය එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස සම්බන්ධ බහු පාර්ශවීය එකඟතා පිළිබඳ ජාතික කේන්ද්‍රීය මධ්‍යස්ථානය යටතේ ගොඩනැගීම හා සවිමත් කිරීම.

ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම තහවුරු කිරීමට පාර්ශවකරුවන් අතර අන්‍යොන්‍ය අවබෝධය සහ විශ්වාසය වර්ධනය කිරීම සඳහා සියලු මට්ටම් වල යහපාලන පුරුදු ඇතිකිරීම.

ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තියේ කාර්ය සාධනය ජාතික,පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් නිසි අධීක්ෂණ හා වාර්තාකරණ ක්‍රමවේද මගින් ඇගයීමට ලක් කළ යුතුය.

**21. පර්යේෂණ හා සංවර්ධනය**

දේශගුණ විපර්යාස ගැටලු පිළිබඳ ජාතික තලයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

දේශගුණ විපර්යාස පිළිබඳ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමට 'කලාපීය හා අන්තර්ජාතික සහයෝගිතා හා සබඳතා' ඇති කර ගැනීම සඳහා දිරි ගැන්වීම සහ සහය වීම.

එසේ ම, එම පර්යේෂණ මගින් අනාවරණය වන කරුණු පිළිබඳ පහළම තලයේ සිටින පාර්ශ්වකරුවන් ඇතුළු සියලු පාර්ශ්ව දැනුම්වත් කිරීමට පියවර ගැනීම.

**22. තාක්ෂණ හුවමාරුව**

දේශීය හා ගෝලීය තාක්ෂණ සහ යහ ක්‍රියා ගවේෂණය කරමින් ඒවායින් දේශීය තත්ත්වයට යෝග්‍ය තාක්ෂණ තෝරා ගැනීම, දැනුම්වත්කිරීම සහ කාර්යක්ෂම අධීක්ෂණයට යටත්ව එකී තාක්ෂණයන් හැකි තාක් දුරට ක්‍රියාත්මක කිරීම.

බුද්ධිමය දේපළ අයිතිය හා අයුතු පරිහරණයට එරෙහිව ආරක්ෂාව තහවුරු කරමින් දේශීය තාක්ෂණ හා සාම්ප්‍රදායික දැනුම අදාළ අංශයන්ට එක්කර ගැනීම හා ඒ සඳහා අනුග්‍රහය දැක්වීම,

**23. නෛතික හා නියාමන රාමුව**

දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති වන අභියෝග වලට මුහුණ දීමට ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම සඳහා නෛතික හා නියාමන යාන්ත්‍රණ සවිමත් කිරීම. ප්‍රධාන ක්ෂේත්‍ර ස්වකීය ව්‍යවස්ථා යටතේ ආංශික නෛතික අවශ්‍යතා අන්තර්ග්‍රහණය කරමින් ඒවා බලාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.

මෙම නියාමන ප්‍රතිපාදන සාධාරණව බලාත්මක කිරීම පිළිබඳ සහතික වීම.

**24.වෙළෙඳපොළ හා වෙළෙඳපොළ මත පදනම් නොවූ යාන්ත්‍රණ**

හරිතාගාර වායු විමෝචන අවම කර ගැනීම හා අනුවර්තන ක්‍රියාමාර්ග වැඩිදියුණු කර ගැනීම සඳහා දේශීය තත්ත්වයන්ට සුදුසු වෙළෙඳපොළ හා වෙළෙඳපොළ මත පදනම් නොවූ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම.

එලෙසම, වර්තමානයේ පවත්නා යෝග්‍ය ක්‍රමවේදයන් නිසි අධීක්ෂණ යාන්ත්‍රණ සමග තවදුරටත් පවත්වා ගැනීම.

දේශගුණ විපර්යාස හේතුවෙන් අහිමිවන ව්‍යාපාරික අවස්ථා අවම කරගැනීමට හා නව ව්‍යාපාරික අවස්ථා හඳුන්වා දීමට අනුවර්තිත අලෙවිකරණ උපායමාර්ග දිරිමත් කිරීම.

**25. සම්පත් සක්‍රීයකරණය**

දේශගුණ විපර්යාස පිළිබඳ ගැටළු පිළිබඳ ජාතික ප්‍රයත්න මෙහෙයවීම සඳහා තිරසාර මූල්‍ය යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.

දේශගුණ විපර්යාස පිළිබඳ කටයුතු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් නිපුණතා වැඩිකිරීම හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණ වැඩිදියුණුකර ස්ථාපිත කිරීම.